sil-06-10-eo-063317-45x3-ja-wss WC 961

# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
# இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபை
# SRI LANKA EXPORT DEVELOPMENT BOARD

## සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය

# ඇබෑර්තු

අපනයන ප්‍රවර්ධන සහ සංවර්ධනය කිරීම සඳහා වූ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයෙහි (EDB) උපාය මාර්ග සැලැස්මේ යෝජිත ක්‍රියාකාරකම් ඇතුළුව අපනයන සංවර්ධන සහ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් ඉටු කිරීම සඳහා දායකත්වය සැපයිය හැකි සනාථ වූ හැකියාවන් හා වෘත්තීය නිපුණතාවයෙන් හෙබි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් පහත සඳහන් තනතුරු පිරවීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. සහකාර අධ්‍යක්ෂ (MM 1-1)

**රැකියා විස්තරය :**

වෙළඳ සංවර්ධන වැඩසටහන් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම, සැපයුම් සංවර්ධන අවස්ථා හඳුනා ගැනීම. කුඩා හා මධ්‍ය පරිමාණ වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම. අපනයනකරුවන්ට බලපාන සාර්ව ආර්ථික ප්‍රශ්නවලට අදාළ අධ්‍යයනයන් සිදු කිරීම සහ එම ප්‍රශ්න විසඳීම සඳහා ප්‍රතිපත්තිමය පියවර නිර්දේශ කිරීම. භාණ්ඩ නිෂ්පාදනය, තත්ත්වය උසස් කිරීම සහ ඇසුරුම් සංවර්ධනය ආදී අවශ්‍ය උපදේශක සේවා ලබා දීම.

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අලෙවිකරණය / ජාත්‍යන්තර සබඳතා ආර්ථික විද්‍යාව / වාණිජ්‍යය / විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය හෝ අදාළ ක්ෂේත්‍රයක උපාධියක් ලබා තිබීම සහ ඉහත සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.

පළමු හෝ දෙවන පෙළ උපාධියක් ලබා ඇති අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

## 02. සහකාර අධ්‍යක්ෂ - මුදල් (MM 1-1)

**රැකියා විස්තරය :**

පොත් තැබීමේ අංශය අධීක්ෂණය කිරීම, වැටුප් සහ වේතන සකස් කිරීම සම්බන්ධ රාජකාරී අධීක්ෂණය කිරීම, අයවැය ලේඛනය, මුදල් ප්‍රවාහ සහ අනිකුත් ප්‍රකාශන / තොරතුරු පිළියෙල කිරීම. පවරා ඇති බලතල යටතේ වවුචර් සකස් කිරීම. මුදල් අධ්‍යක්ෂකගේ මග පෙන්වීම යටතේ අපනයන සංවර්ධන අරමුදල කළමනාකරණය කිරීමට අයත් රාජකාරි කටයුතුවල නියැලීම.

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගිණුම්කරණය හෝ අදාළ ක්ෂේත්‍රයක උපාධියක් ලබා තිබීම හෝ

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය, (ICASL) මගින් පවත්වනු ලබන අන්තර් මාධ්‍ය මට්ටමේ සුදුසුකම් ලබා තිබීම හෝ

වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය (CIMA) මගින් පවත්වනු ලබන අන්තර් මාධ්‍ය මට්ටමේ සුදුසුකම් ලබා තිබීම හෝ

වරලත් සහතිකලත් ගණකාධිකාරී ආයතනය (ACCA) මගින් පවත්වනු ලබන අන්තර් මාධ්‍ය මට්ටමේ සුදුසුකම් ලබා තිබීම හෝ

ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDA) සමත්ව තිබීම සහ

ඉහත සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක මූල්‍ය හා ගිණුම්කරණය පිළිබඳ අවම වශයෙන් වසර එකක් (01) පළපුරුද්දක් ලබා තිබීම.

**සටහන :** පරිගණකගත ගිණුම්කරණ පිළිබඳ දැනුම ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

**වැටුප් පරිමාණය : (MM 1-1)**

රු. 53,175/- 10x1,375 - 15x1,910 = රු. 95,575/- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (**DMS**) අංක 2/2016 දරන චක්‍රලේඛයේ ඇමුණුම ii හි සඳහන් උපදෙස්වලට අනුකූලව වැටුප් ගෙවනු ලැබේ.

## 03. අපනයන ප්‍රවර්ධන නිලධාරී (JM 1-1)

**රැකියා විස්තරය :**

අංශයේ / ඒකකයේ මෙහෙයුම් කාර්යයන් ඉහළ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම. අදාළ නිෂ්පාදන ක්ෂේත්‍රයට සම්බන්ධ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම. අදාළ ක්ෂේත්‍රය සඳහා දත්ත / තොරතුරු යාවත්කාලීන කිරීම. භාණ්ඩ හා සේවා අපනයනය ප්‍රවර්ධනය කිරීම සහ සම්බන්ධ වෙනත් කාර්යයන්හි නිරත වීම.

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අලෙවිකරණය / ජාත්‍යන්තර සබඳතා / ආර්ථික විද්‍යාව / වාණිජ්‍යය / විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය හෝ අදාළ ක්ෂේත්‍රයක උපාධියක් ලබා තිබීම.

පළමු හෝ දෙවන පෙළ උපාධියක් ලබා ඇති අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

## 04. පරිගණක වැඩසටහන් සම්පාදක (JM 1-1)

**රැකියා විස්තරය :**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සියලුම අංශ / ඒකකවල මෙහෙයුම් කටයුතු නංවාලීම සඳහා පරිගණක වැඩසටහන් සංවර්ධනය කිරීම. එවැනි වැඩසටහන් පවත්වාගෙන යෑම සහ අවශ්‍ය වූ විට ඒවා නවීකරණය කිරීම.

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් B.Sc. උපාධියක් හෝ එක්සත් රාජධානියේ කළමනාකරණ තොරතුරු පද්ධති ආයතනයේ සාමාජිකත්වය ලබා තිබීම.

**වැටුප් පරිමාණය : (JM 1-1)**

රු. 42,600/- 10x755 - 18x1,135 = රු. 70,580/- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (**DMS**) අංක 2/2016 දරන චක්‍රලේඛයේ ඇමුණුම ii හි සඳහන් උපදෙස්වලට අනුකූලව වැටුප් ගෙවනු ලැබේ.

**වයස :**

අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. මෙම උපරිම වයස් සීමාව රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනවල අයදුම්කරුවන්ට සහ අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

## තෝරා ගැනීමේ ක්‍රමය (MM 1-1 හා JM 1-1)

ලිඛිත තරග විභාගයක සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත

**වෙනත් ප්‍රතිලාභ :**

- ❖ වෛද්‍යාධාර යෝජනා ක්‍රමය
- ❖ රජය අනුමත සහන පොළී ප්‍රමාණයන් යටතේ නිවාස ණය හා ආපදා ණය
- ❖ ලබා නොගත් වෛද්‍ය නිවාඩු මූල්‍යකරණය සහ වාර්ෂික ප්‍රසාද දීමනා
- ❖ තෝරා ගත් බස් මාර්ග සඳහා ප්‍රවාහන පහසුකම්
- ❖ සේවක අර්ථසාධක අරමුදල – සේවකයාගෙන් 10% ආයතනයෙන් 15% සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල – ආයතනයෙන් 3%

**අයදුම් කිරීමේ පිළිවෙළ :**

අදාළ අයදුම්පත්‍ර ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ, 5 වන මහලේ පිහිටි මානව සම්පත් කළමනාකරණ අංශයෙන් හෝ www.srilankabusiness.com වෙබ් අඩවියෙන් ("Announcements" කාණ්ඩය යටතේ) ලබාගත හැක. සම්පූර්ණ ජීව දත්ත සඳහන් අයදුම්පත් එක් එක් තනතුර සඳහා වෙන් වෙන්ව අදාළ සියලුම සහතික පත්‍රවල පිටපත් සමග 2018.06.28 වැනි දිනට පෙර පහත සඳහන් ලිපිනයට සභාපතිනිය සහ ප්‍රධාන විධායක වෙතට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. රාජ්‍ය අංශයේ සේවකයන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.


**සභාපතිනිය සහ ප්‍රධාන විධායක,**

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,**

**NDB-EDB ටවර්. 42, නවම් මාවත, කොළඹ 02.**

**දුරකථන : 011-2300700 / ෆැක්ස් : 011-2300715**

**වෙබ්. www.srilankabusiness.com**